## 143 – පුංචි අපෙන්

පුංචි අපෙන් නැගෙන සිනා ජේසුට බාරයි
පුංචි අපෙන් වැටෙන කඳුළු ජේසුට බාරයි
පුංචි අපට ලැබෙන ජයත් ජේසුට බාරයි
පුංචි අපේ පාරජයත් ජේසුට බාරයි

පුංචි අපේ දුක් දොම්නස් ජේසුට බාරයි
පුංචි අපේ සැප සම්පත් ජේසුට බාරයි
පුංචි අපේ ගුරු දෙගුරුන් ජේසුට බාරයි
පුංචි අපේ හිත මිතුරන් ජේසුට බාරයි

පුංචි අපේ සිහිය නුවණ ජේසුට බාරයි
පුංචි අපේ හැම සිතුවිලි ජේසුට බාරයි
පුංචි අපට අයිති දෙයත් ජේසුට බාරයි
පුංචි අපේ ජීවිතයත් ජේසුට බාරයි